ශ්‍රී ලංකා පදනම - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පදනමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව,පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රු.2,754,664 ක් වූ එකතු කළ අගය මත බදු හා ආරම්භ කල ව්‍යාපෘතියක් සඳහා රු.1,489,044 ක ප්‍රතිපාදනය නොනිමි වැඩ ලෙස ගිණුම්වල ඇතුලත් වීම නිසා නොනිමි වැඩ හා උපචිත වියදම් රු. 4,243,708 කින් වැඩියෙන් දක්වා තිබුණි.	නොනිමි වැඩ තුල ඇතුලත් නියමිත කොන්ත්‍රාත් අගය හා එකතු කල අගය මත බදු පරික්ෂා කර බලා ඉතිරි කටයුතු කරනු ලබන බව.	නොනිමි වැඩ හා උපචිත වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	බැංකුව වෙත සෘජුව ලැබී තිබුණු තැන්පතු රු.1,594,171ක් නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත නොකර, අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	සෘජු බැර කිරීම් වලට අදාල තොරතුරු නොලබන තැන්පතු සඳහා නිවැරදි කිරීම් සිදු කරන බව.	සෘජු තැන්පත් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.5.3 අවිනිශ්චිත ගිණුම්

විෂය	මුදල	අවිනිශ්චිත ලෙස තිබූ කාලය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අවිනිශ්චිත ගිණුම	රු.189,587	2015-2024	මු.රෙ 104 පරීක්ෂණයක් සිදුකරමින් පවතින බවත් එහි නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකිරීමට සිදුකරන බව.	අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2010 සිට 2019 වර්ෂය දක්වා වසර 5 කට වැඩි කාලයක් පදනම විසින් පවත්වා ඇති අධ්‍යාපනික වැඩ සටහන් සහ වැඩමුළු වෙනුවෙන් විවිධ ආයතන වලින් ලැබිය යුතු රු.2,722,427 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.	හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව.	හිඟ ආදායම් අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2014 සිට 2021 වර්ෂය දක්වා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් බාහිර පාර්ශවයන්ට සපයන ලද සේවා වෙනුවෙන් අයවිය යුතු රු.895,437 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2014 සිට 2021 දක්වා ලැබිය යුතු රු.895,437 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කළද ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැති බව.	හිඟ ආදායම් අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පදනමේ අංක 123 දරණ peo TV නාලිකාව, චිත්‍රාගාරය, පාලන පරිශ්‍රය, නිෂ්පාදන උපකරණ සහ අදාළ සේවාවන් කුලී පදනම මත ලබාදීමට අදාළව 2022 පෙබරවාරි මස 10 වන දින පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි.එම ගිවිසුමෙහි සඳහන් කොන්දේසි අංක 4,5,7 සහ 8 අනුව පිළිවෙලින් කාර්යාලීය පරිශ්‍රය භාවිතා කිරීම වෙනුවෙන් මාසිකව රු.285,000 ක කුලියක් ගෙවීමට ද TV නාලිකාවේ බදු කුලිය වාර්ෂිකව 10% කින් වැඩි කිරීමට යටත්ව මාසිකව රු.500,000 ක බදු කුලියක් ගෙවීමට ද නාලිකාවේ	අදාල මුදල අයකර ගැනීම සඳහා නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.	හිඟ ආදායම් අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

	වැඩ සටහන් විකාශනය කිරීම වෙනුවෙන් දරණ ලද සියළුම වියදම් වන නිෂ්පාදන වියදම, TV නාලිකා වියදමට ඇතුළත් දුරකථන හා අන්තර්ජාල පහසුකම් ද, එය භාවිතයට ඇතුළත් බදු කුළිය හා ගාස්තු ගෙවීම ද, විදුලිය පරිභෝජනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු ආදිය ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට බැඳී තිබූ නමුත් 2022 වර්ෂය සඳහා රු. 1,217,696 ද,2023 වර්ෂය සඳහා රු.8,724,248 ක්ද 2024 වර්ෂය වෙනුවෙන් 1,999,534 ක්ද වශයෙන් රු. 11,941,478 ක මුදලක් අයවිය යුතුව තිබුණි.		
(ඈ)	සේවය හැරයන නිළධාරීන්ගෙන් අයවිය යුතු මුදල් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2021 වර්ෂයේ රු.1,558,240 ක මුදලකට ගිවිසුම් ගත වී විදේශගත වූ නිළධාරියෙකුගෙන් අයවිය යුතු මුදල හා දැනුම් දීමකින් තොරව සේවයෙන් ඉවත් වූ නිළධාරීන්ගෙන් 24 දෙනෙකුගෙන් වසර 1 සිට 9 ත් දක්වා කාලයක් රු.2,504,759 ක් ද, එමෙන්ම 2024 වර්ෂයේ සේවය හැර ගිය පුද්ගලයන් පස්දෙනෙකුගෙන් රු.345,221 ක් වශයෙන් අයවිය යුතු ශේෂයන් පැවතුණි.	මේ වන විට සේවයෙන් ඉවත්ව යන නිලධාරීන්ගෙන් අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු සිදු කරනු ලබන බව.	සේවකයින්ගෙන් ලැබිය යුතු මුදල් අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථාවලදී ඊට අදාළ විගණන නිරීක්ෂණ මෙම මාතෘකාව යටතේ දැක්විය යුතුය.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය			

(i)	V වැනි පරිච්ඡේදය 2.1 ඡේදය	රජයේ සේවයෙන් පරිබාහිර සේවයක් සඳහා නිලධාරියෙකු මුදාහැරිය හැක්කේ ,පත් කරන බලධාරියාගේ අවසරය සහ ඒ සංස්ථාව හෝ මණ්ඩලය හෝ ස්ථාපනය කරන ලද නීතියෙන් නියම වන පරිදි එකඟත්වය ලබාගත යුතු වෙනත් බලධාරියෙකු ඇත්නම් ඔහුගේද අවසරය ඇතිව පමණක් වුවද, ශ්‍රී ලංකා නාවික හමුදාවේ ලුතිනන් කමාන්ඩර් නිලයෙහි රාජකාරි ඉටු කරමින් සිටි නිලධාරියෙකු රාජ්‍ය සංස්ථාවක රාජකාරි සිදුකිරීම සඳහා තාවකාලිකව හෝ ස්ථිරව රාජ්‍ය සේවයෙන් මුදාහැර නොතිබියදී, 2021අගෝස්තු 02දින ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ පරිපාලන තනතුරෙහි රාජකාරි භාරගෙන තිබුණි.	මෙම නිලධාරියා පිලිබඳ මූලික විමර්ශනයක් සිදු කර පරිවාස කාලය තුල සේවය අවසන් කර ඇති බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.
(ii)	vii වැනි පරිච්ඡේදය 12.2.5 වගන්තිය	නිසි පත්කිරීමේ බලධරයා විසින් ඔහු විධිමත් ලෙස පත්කරනු ලැබුවහොත් මිස රාජකාරි ආවරණය කරන නිලධාරියෙකුට වැඩ බැලීමේ වැටුපක් නොහොත් කිසිදු අතිරේක පාරිශ්‍රමිකයක් ලබා ගැනීමට නොහැකි බව දක්වා තිබියදී, පදනමේ අධ්‍යක්ෂක අධ්‍යයන තනතුරේ	මේ වන විට හිටපු අධ්‍යක්ෂ (අධ්‍යාපන) මියගොස් ඇති බවත් මේ සම්බන්ධව කම්කරු කොමසාරිස්ගේ උපදෙස් පරිදි කටයුතු කරමින් පවතින බව.	මෙම මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

		රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් ,2021 ,2022 හා 2023වර්ෂයන් තුළ දී රු.599,979 ක මුදලක් වැඩ බැලීමේ දීමනා ලෙස නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.		
(iii).	xii පරිච්ඡේද 14.3.3 වගන්තිය	සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු පිළිබඳ ඉල්ලීම ආයතන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවද, ආයතනයේ සේවයේ නියුතු කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සඳහා 2021 සිට 2023 වර්ෂය දක්වා වර්ෂ 2ක් සහ මාස 6ක කාලයක් සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාදී රු.8,030,919ක වැටුප් ගෙවා තිබු නමුත් එක් කථිකාචාර්යවරයකු අදාළ සුදුසුකම් සපුරා ඇතිබවට තහවුරුවක් නොවීය.	කළමනාකරණ මණ්ඩල අනුමැතිය පරිදි මෙම නිලධාරීන්ට නිවාඩු අනුමැතිය ලබා දී ඇති බවත් ඉදිරියේදී මෙවැනි අවස්ථාවල ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන කටයුතු සිදු කරනු ලබන බව.	ආයතනය සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iv).	xii පරිච්ඡේදය14.6 වගන්තිය	ආයතනයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සඳහා වර්ෂ 2ක් සහ මාස 6ක කාලයක් සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සඳහා සේවය කල යුතු අනිවාර්ය සේවා කාලය වෙනුවෙන් ගිවිසුමකට එළැඹ නොතිබීම හේතුවෙන් එක් කථිකාචාර්යවරයකු අවශ්‍ය පහසුකම ලබාගත්තද ආයතනයට සේවය කිරීමකින් තොරව 2023	ගිවිසුම අත්සන් කිරීම අනිවාර්ය කර ඇති බව .	ආයතනය සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

		නොවැම්බර් 23 සේවයෙන් ඉවත්වී තිබුණි.		
(ආ)	අංක 2001.03.137 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය	සෑම කථිකාචාර්යවරයෙකුම මාසිකව ප්‍රගති වාර්තා පවත්වා ගතයුතු වුවද 2024 වර්ෂයේදී ද මාසික ප්‍රගති වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේදී සෑම කාර්තුවකටවරක් මෙම වාර්තාව ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	1995 සැප්තැම්බර් 07 දිනැති අංක 8/887දරන ගැසට් පත්‍රය	තෘතීයික හා වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වනු ලබන ආයතන ,තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) තම ආයතන විසින් පවත්වනු ලබන පාඨමාලා ලියාපදිංචි කර ,වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කළ යුතුය .පදනම විසින් 2024 දෙසැම්බර් 31 දින වන විටත් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා තාවකාලික ලියාපදිංචියක් පමණක් ලබා ගෙන තිබුණි.	මේ සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කරමින් පවතින බව.	1990 අංක 20 දරණ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන පනතේ 15 වන වගන්තිය අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 132,402,966 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,806,726 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 123,596,240 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රාග්ධන වියදම් සඳහා රු.මි. 90ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම , අනෙකුත් ආදායම් රු.19,929,590 කින් වැඩිවීම , පුහුණු හා අධ්‍යාපනික වියදම් රු.14,950,888කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
පදනමේ අධ්‍යක්ෂ (අධ්‍යයන) තනතුරෙහි සේවය කල නිලධාරියා 2020 අගෝස්තු 28 දින සිට ස්ථිර විශ්‍රාම ගැන්වීම හේතුවෙන්,ශ්‍රී ලංකා පදනම එදිරිව එම නිලධාරියා විසින් පවරා තිබූ නඩුවේ 2023 ජූලි 07 දිනැති නඩු තීන්දුව පරිදි ඔහුට හිමි සියළු හිඟ වැටුප් ගෙවීමට සහ අධ්‍යක්ෂ (අධ්‍යයන) තනතුරෙහි නැවත සේවයේ පිහිටුවීමට සිදු වී තිබුණි.පදනමේ දුර්වල කළමනාකරණ තීරණ හේතුවෙන් පදනම වෙනුවෙන් සේවය නොකල 2019 අප්‍රේල් සිට 2023 නොවැම්බර් මාසය දක්වා හිඟ වැටුප්,සේවක අර්ථසාධන අරමුදල සඳහා දායක මුදල්,සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් සහ නීතිඥ ගාස්තු ලෙස පිළිවෙලින් රු. 4,041,301 ක්, රු. 1,132,573 ක්, රු. 135,908 ක් සහ රු. 390,466 ක් බැගින් එකතුව රු.5,700,250 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.	මෙය කළමනාකරණ මණ්ඩල අනුමැතිය සමඟ ගනු ලැබූ තීරණයක් බවත් කම්කරු උසාවියෙන් ලද තීන්දුව අනුව මෙම කටයුතු එකඟතාවයක් මත සිදු කර ඇති බව.	කළමණාකරනය විසින් තීරණ ගැනීමේදී නීත්‍යානුකූල හා විනිවිධභාවයෙන් යුතු තීරණ ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලද රු.මිලියන 90 ක් වූ මුදලින් නිමවූ වැඩ සඳහා රු. මිලියන 44 ක් පමණක් ගෙවා ඇති බව 2025 මැයි 14 දින විගණනය වෙත දැනුම්දී තිබුණද 2025 පෙබරවාරි 20 වන දින අමාත්‍යාංශ ලේකම් වෙත යවන ලද 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳ ප්‍රගතිය අනුව සියළුම ව්‍යාපෘති නිම කර ගෙවීම් සිදු කර ඇති බව වාර්තා කර තිබුණි.	2024 වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.මි.90 ක මුදලක් පමණක් ආයතනය වෙත ලැබී තිබූ බවත් නිම වූ වැඩ සඳහා රු.මිලියන 44 ක මුදලක් ගෙවා ඇති බවත්,කොන්ත්‍රාත් පිරිනමා වැඩ අවසන් වන තුරු අනෙක් මුදල් උපචිත වියදම් යටතේ දක්වා ඇති බව.	නිවැරදි හා යාවත්කාලීන තොරතුරු සැපයීම කළමනාකාරීත්වයේ වගකීම වන අතර නිවැරදි තොරතුරු සැපයිය යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොඩනැගිලි පරිශ්‍රයේ මාසික බදුකුලිය රු.225,000ක් සහ නාලිකාවේ මාසික බදු කුලිය රු.500,000 ක් ලෙස තීරණය කිරීමේදී රජයේ තක්සේරු වටිනාකම ද,වෙළඳපොල තුල ද වර්තමානයේ පවතින මිල ගණන් ද ඇගයීම් කර මාසික බදු කුලිය තීරණය කර නොතිබූ අතර මෙම ගොඩනැගිල්ල හා නාලිකාව බදු දීමේ දී විත්‍රාගාරය හා එහි පවතින නිෂ්පාදන උපකරණ වල ආරක්ෂාව හා පැවැත්ම වෙනුවෙන් ආරක්ෂිත තැන්පතුවක් (Security Bond) ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට කටයුතු කරනු ලබන බව.	බදු දීමේ නිසි ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රවණාගාර ප්‍රතිසංස්කරණය,නව ඇඳුම් මාරු කිරීමේ කාමරය සහ ආරක්ෂක විවේකාගාරය පුළුල් කිරීම වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ ඇති කරන ලද එකඟතාවය අනුව ඇස්තමේන්තු වටිනාකමින් සියයට 25 ක් වූ රු. 3,628,225 ක් 2024 ඔක්තෝබර් 29 වන දින ගෙවා තිබූ අතර ඉතිරිය වූ රු.10,071,775 ක මුදල සඳහා 2024 දෙසැම්බර් 31 දිනැති අංක 596355 දරන චෙක්පත මඟින් ගෙවීම් සිදුකල බව සඳහන් කරමින් ඇති හිස් චෙක්පතක් වශයෙන් ආයතනය තුළ රඳවාගෙන තිබූ අතර 2025 මාර්තු 31 වන දින වන විටද මෙම කාර්යය ආරම්භ කර නොතිබුණි.	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත අත්තිකාරම් මුදල පමණක් ගෙවා ඇති බවත් එම දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව වෙනස් වීම නිසාත් නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට සිදුවීම නිසාත් යම් ප්‍රමාදයන් සිදු වූ බව.	සැලසුම්කල ව්‍යාපෘති නියමිත කාලය තුළ ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. කාර්යය නිමවන තුරු චෙක්පත් ලියා රඳවා තබා නොගත යුතුය.

(ආ)	චිත්‍රාගාරය ඉදිකිරීමට අදාල වාස්තු විද්‍යාත්මක කටයුතු හා උපදේශක සේවා වෙනුවෙන් 2019 වර්ෂයේදී රු. 1,049,124 ක මුදලක් ගෙවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.	එවකට පැවති කළමනාකරණ මණ්ඩලය මගින් ගත් තීරණයකට අනුව චිත්‍රාගාරයේ ඉදිකිරීමට අදාළ වාස්තු විද්‍යාත්මක කටයුතු හා උපදේශන සේවා ලබා ගෙන ඇති බවත්, ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකි වීම මත චිත්‍රාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සැලසුම්වලට පමණක් සීමා කර ඇති බව.	ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යයභාරයන් සැලසුම් කළ යුතු අතර නිසි පරිදි ක්‍රියාත්මක කිරීමටද කටයුතු කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව විසින් ශක්තිමත්භාවය සම්බන්ධ ගැටළු පැවතීම හේතුවෙන් කුඩා ශ්‍රවණාගාරයේ ඉදිකිරීම කටයුතු භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබූ අතර 2025 පෙබරවාරි 03 වන දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙතින් ගොඩනැගිල්ලේ ශක්තිමත්භාවය සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදු කළ යුතු බව දැනුම් දී තිබියදී ද ප්‍රමාණපත්‍ර (BOQ) හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් රු මිලියන 2 ක මුදලක් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඉල්ලීම පරිදි පදනම විසින් සමාලෝචිත වර්ෂයේ නොනිමි වැඩ යටතේ දක්වා තිබුණි.	ඉදිරි ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇති මෙම ගොඩනැගිල්ලේ යෝග්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත වාර්තාවක් කැඳවා ඇති බවත්. එම වාර්තා හා අනෙකුත් ලියවිලි ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතියකින් පසු අයවැය ලේඛනයට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන බව.	නිසි ඇගැයීමක් සිදු කර කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය වන විට රු. 3,262,424 ක් රැඳවුම් මුදල් ලෙස දක්වා ඇති අතර ඒ තුළ 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු. 2,095,751 ක නිරවුල් නොකළ ශේෂයක් පැවතිණි.	කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරන ලද කාර්යයන්වල ගුණාත්මකභාවය පිළිබඳ ගැටළු පැවති නිසා රඳවා ගැනීමේ මුදල් නිරවුල් කිරීමට නො හැකි වී ඇති බව.	කොන්ත්‍රාත් කටයුතුවල පවතින අඩුපාඩු නිරවුල් කරගෙන රඳවා ගැනීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 අගෝස්තු 02 දින පදනමේ අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරෙහි රාජකාරි බාරගෙන තිබුණු නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා සේවයෙන් 2021 නොවැම්බර් 05 දින විශ්‍රාම ගොස් තිබුණු අතර 2021 අගෝස්තු 02 දින සිට 2021 නොවැම්බර් 05 දින දක්වා කාල සීමාව තුලදී පදනම සහ ශ්‍රී ලංකා නාවික හමුදාව යන ආයතන දෙකෙන්ම වැටුප් සහ දීමනා ලෙස පිළිවෙලින් රු. 495,759 සහ රු. 319,669 ලබාගෙන තිබුණි.	මෙම නිලධාරියාගේ පරිවාස කාලය තුල සේවය අවසන් කර ඇති බවත්, මේ වන විට නඩු කටයුත්තක් පවතින බව.	විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජනවාරි 09 වන දින අනුමත කරන ලද අධ්‍යයන අංශයේ ක්‍රියාකාරී සැලැස්ම 2024 නොවැම්බර් මස 12 වන දින සංශෝධනය කර තිබූ අතර ඉන් පාඨමාලා වර්ග 52 ක් ඉවත් කර එම සංශෝධිත සැලැස්මෙහි ඇතුළත් පාඨමාලා වර්ග 19 ක් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර නොතිබුණද ඊට ඇතුළත් නොවූ පාඨමාලා වර්ග 38 පවත්වා තිබුණි.	අධ්‍යයන අංශයෙහි සිටින කථිකාචාර්යවරු 4 දෙනාට පැවැත්විය හැකි පාඨමාලා හා වැඩමුළු පමණක් මෙම සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරන ලද බවත් මෙහිදී ද බොහෝ පාඨමාලා හා වැඩමුළු සඳහා පවතින ඉල්ලුම හා රටේ පවතින වාතාවරණය මත අලෙවි කිරීමට නොහැකි වූ බවත් රාජ්‍ය අංශයේ පුහුණු ඇස්තමේන්තු කපා හැර තිබූ බැවින් රාජ්‍ය අංශයේ පුහුණු කිරීම් අඩුවීමත් හේතු වූ බව.	ක්‍රියාකාරී සැළැස්මට අනුකූලව සැලසුම් කල කාර්යයන් ඉටු කළ යුතුය.